මෙම සමීක්ෂණයෙහි ප්‍රමුඛ අරමුණක් වූයේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් කියවීම් ද්‍රව්‍ය මිල දී ගැනීමේ ස්වභාවය හඳුනා ගැනීමයි. ඒ අනුව පසුගිය මාස 06ක කාලය තුළ පාඨකයන් හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් විසින් කියවීම් ද්‍රව්‍ය මිල දී ගැනීම සම්බන්ධයෙන් තොරතුරු ලබා ගන්නා ලදී.




ප්‍රස්තාර අංක 23 : ප්‍රතිචාරිකයින් විසින් හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් විසින් පසුගිය මාස 06 තුළ කියවීම් ද්‍රව්‍ය මිල දී ගැනීම

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ඉහත සඳහන් ප්‍රස්තාර අංක 23ට අනුව 84%ක් එනම් බහුතරයක් වන ප්‍රතිචාරිකයින් විසින් හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් විසින් පසුගිය මාස 06 තුළ කියවීම් ද්‍රව්‍ය මිල දී ගෙන ඇති බවයි.

මුලු ප්‍රතිචාරිකයින් අතරින් 10% ක ප්‍රමාණයක් සඳහන් කර තිබෙන්නේ පසුගිය මාස 06 ක කාලසීමාව තුළ කිසිදු කියවීම් ද්‍රව්‍යයක් මිල දී ගෙන නොමැති බවයි. එසේම 5%ක පිරිසක් මේ සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් ලබා දී නොමැත. ඒ අනුව පැහැදිලි වන්නේ පසුගිය මාස 06 තුළ බහුතරයක් වන ප්‍රතිචාරිකයින් විසින්, ඔවුන් හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් විසින් කියවීම් ද්‍රව්‍ය මිල දී ගෙන ඇති බවයි.

### 2.4.3 කියවීම් ද්‍රව්‍ය මිල දී නොගැනීමට මුල් වූ හේතූන්

පසුගිය මාස 06ක කාලසීමාව තුළ කියවීම් ද්‍රව්‍ය මිල දී නොගත් ප්‍රතිචාරිකයන්ගෙන් ඊට බල පෑ හේතු විමසන ලද අතර එහිදී විවිධාකාරයේ හේතූන් කිහිපයක් ඉදිරිපත් කර තිබේ.




ප්‍රස්තාර අංක 24 : පසුගිය මාස 06ක කාලසීමාව තුළ කියවීම් ද්‍රව්‍ය මිල දී නොගැනීමට හේතු

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

පසුගිය මාස 06 ක කාලසීමාව තුළ කියවීම් ද්‍රව්‍ය මිල දී නොගැනීමට හේතුන් ලෙස පිළිවෙළින් වැඩි ප්‍රතිශතයක් සඳහන් කර තිබෙන්නේ පසුගිය මාස 06 කාලසීමාව තුළ දී මහජන පුස්තකාලය හා පාසල් පුස්තකාලය පරිශීලනය කළ බැවින් කියවීම් ද්‍රව්‍ය මිල දී නොගත් බවයි. එම අගය ප්‍රතිශතයක් ලෙස 60%කි. එසේම මුදල් හිඟකම, පොත්වල මිල ඉහළ යාම, පහසු වේලාවක් නොමැතිවීම, පොත් මිල දී ගැනීමට කැමැත්තක් නොමැති වීම, පවුලේ සාමාජිකයන් තුළ ඒ කෙරෙහි දක්වන අවධානය අඩු බව සහ පවුලේ සාමාජිකයන්ගෙන් හා මිතුරන්ගෙන් කියවීම් ද්‍රව්‍ය ලැබීම යන වෙනත් හේතුන් නිසා පසුගිය මාස 6ක කාලසීමාව තුළ කියවීම් ද්‍රව්‍ය මිල දී ගැනීමට වැඩි කැමැත්තක් දක්වා නොමැති බව ද මේ ඔස්සේ අනාවරණය වේ.

### 2.4.4 පසුගිය මාස 6ක කාලසීමාව තුළ මිල දී ගත් කියවීම් ද්‍රව්‍ය

පෙර සඳහන් කළ පරිදි පසුගිය මාස 06ක කාලසීමාව තුළ මුළු ප්‍රතිචාරිකයන් සංඛ්‍යාවෙන් 84%කට ආසන්න ප්‍රතිශතයක් කියවීම් ද්‍රව්‍ය මිල දී ගෙන තිබූ අතර ප්‍රතිචාරිකයන් විසින් එසේ මිල දී ගත් කියවීම් ද්‍රව්‍ය යටතේ පොත්, සඟරා, පුවත්පත් හා වෙනත් කියවීම් ද්‍රව්‍ය පිළිබඳ මෙහිදී අවධානය යොමු කෙරිණි.




ප්‍රස්තාර අංක 25 : ප්‍රතිචාරිකයින් විසින් පසුගිය මාස 6ක කාලසීමාව තුළ මිල දී ගත් කියවීම් ද්‍රව්‍ය

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් මාස 6ක කාලසීමාව තුළ පොත්, සඟරා හා පුවත්පත් යන කියවීම් ද්‍රව්‍ය මිල දී ගැනීම කෙරෙහි පාඨකයන් තම ප්‍රමුඛත්වය ලබා දී තිබේ. ඒ අනුව මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් වැඩි ප්‍රමාණයක් විසින් මාස 6ක කාලසීමාව තුළ පොත් මිල දී ගැනීම (37%) සිදු කර තිබේ. ඊට අමතරව පුවත්පත් (35%) හා සඟරා (27%) මිල දී ගැනීම් කටයුතු සිදු කර ඇති බව අනාවරණය වේ.

මෙම කියවීම් ද්‍රව්‍ය වලට අමතරව පාඨකයන් විසින් කැමැත්තක් දක්වනු ලබන වෙනත් කියවීම් ද්‍රව්‍ය මිල දී ගැනීම කෙරෙහි ද මෙහිදී අවධානය යොමු කළ අතර එහිදී හඳුනා ගත හැකි වූයේ CD/DVD හා පරිගණකය තම කියවීම් ද්‍රව්‍ය ලෙස භාවිත කරන බවයි.

### 2.4.5 මහජන පුස්තකාලයට අමතරව භාවිත කරනු ලබන වෙනත් පුස්තකාල වර්ග

මෙම අධ්‍යයනය හරහා මහජන පුස්තකාල පද්ධතියට අමතරව පාඨකයන් විසින් භාවිත කරනු ලබන වෙනත් පුස්තකාල වර්ග පිළිබඳව විමසන ලදී ඒ අනුව පාසල් පුස්තකාල, විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපනික පුස්තකාල, ළමා සමාජ පුස්තකාල, යෞවන සමාජ පුස්තකාල හා රාජ්‍ය නොවන සංවිධාන පුස්තකාලවල භාවිතය පිළිබඳව පාඨකයන් ප්‍රතිචාර දක්වා ඇත.




ප්‍රස්තාර අංක 26 : මහජන පුස්තකාලයට අමතරව භාවිත කරනු ලබන වෙනත් පුස්තකාල වර්ග

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ලබා ගත් දත්ත වලට අනුව අනාවරණය වන්නේ මහජන පුස්තකාලවලට අමතරව බහුතර ප්‍රතිචාරිකයන් සංඛ්‍යාවක් විසින් පාසැල් පුස්තකාල භාවිත කිරීමට කැමැත්තක් දක්වන බවයි. බොහෝ විට ප්‍රතිචාරිකයන්ගේ ප්‍රජා විද්‍යාත්මක, සමාජීය හා ආර්ථික සාධක පදනම් කර ගනිමින් මෙහි යම් යම් වෙනස්කම් සිදු විය හැක. උදාහරණයක් ලෙස වයස අවුරුදු 11 - 15ත් අතර වයස් කාණ්ඩයෙහි නියෝජනය ඉහළ අගයක් ගන්නා බැවින් පාසැල් පුස්තකාල භාවිතයට දක්වන කැමැත්ත ද ඉහළ අගයක් ගන්නා බව පැහැදිලි වේ.

මීට අමතරව යෞවන සමාජ පුස්තකාල (15%), විශ්ව විද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතනික පුස්තකාල හා රාජ්‍ය නොවන සංවිධාන ආශ්‍රිත පුස්තකාල භාවිතා කිරීම කෙරෙහි ද ප්‍රතිචාරිකයන් වැඩි රුචිකත්වයක් දක්වන බව ද මෙම අධ්‍යනය තුළින් අනාවරණය වේ.

ඉහත සඳහන් කළ පුස්තකාල වර්ගවලට අමතරව දහම් පාසල් පුස්තකාල, සංස්කෘතික මධ්‍යස්ථාන, ආගමික ස්ථාන ආශ්‍රිත පුස්තකාල හා රාජ්‍ය ආයතන ආශ්‍රිත පුස්තකාල පිළිබඳව පාඨකයන් ප්‍රතිචාර දක්වා ඇත.

## 2.5 කියවන පරිසරය හා බාධක

### 2.5.1 නිවෙස් තුළ පොත් එකතුවක් පවත්වාගෙන යාම

මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ මෙම සමීක්ෂණය හරහා ඔවුන්ගේ කියවීම ආශ්‍රිත පරිසරය හා කියවීමේදී ඇති වන බාධක සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී.




ප්‍රස්තාර අංක 27 : නිවෙස් තුළ පොත් එකතුවක් පවත්වාගෙන යාම

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ප්‍රතිචාරිකයන්ගේ නිවෙස් තුළ පොත් එකතුවක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තොරතුරු ලබා ගත් අතර එහිදී අනාවරණය වූයේ මුළු ප්‍රතිචාරිකයන් අතරින් 72%ක ප්‍රතිශතයක් තම නිවසේ පොත් එකතුවක් පවත්වාගෙන යන බවයි. එමෙන්ම 21%ක ප්‍රමාණයක් පොත් එකතුවක් පවත්වාගෙන නොයන බව ද සඳහන් කර තිබේ. 7%ක් මේ සඳහා නිශ්චිත පිළිතුරක් ලබා දීමක් සිදු කර නොමැත. මින් පැහැදිලි වන්නේ බහුතර පාඨකයින් විසින් තම නිවෙස් තුළ පොත් එකතුවක් පවත්වාගෙන යාමට වැඩි කැමැත්තක් දක්වන බවයි.

### 2.5.2 කියවීමට වඩාත් කැමති ස්ථාන

නිවස, පාසල් පුස්තකාලය, මහජන පුස්තකාලය හා වෙනත් පුස්තකාල අතරින් ප්‍රතිචාරිකයින් විසින් කියවීමට වඩාත් කැමති ස්ථාන පිළිබඳව ද අධ්‍යයනයට භාජනය කරන ලදී.




ප්‍රස්තාර අංක 28 ඃ කියවීමට වඩාත් කැමති ස්ථාන

මූලාශ්‍රය ඃ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ප්‍රතිචාරිකයින් විසින් කියවීම් කටයුතු සඳහා වඩාත් කැමති ස්ථාන පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී අනාවරණය වන්නේ තම නිවස තුළ කියවීම් කටයුතු සිදු කිරීම සඳහා කැමැත්තක් දක්වන බවයි. මුලු ප්‍රතිචාර අතරින් එම අගය 40.1%කි. මහජන පුස්තකාල ආශ්‍රිතව තම කියවීම් කටයුතු සිදු කිරීමට කැමැත්තක් දක්වන ප්‍රතිශතය 35.6%ක් වේ. එම ස්ථාන දෙකට අමතරව පාඨකයන් විසින් තෙවනුව හා සිවුවෙනුව පිළිවෙළින් ප්‍රමුඛත්වය ලබා දී තිබෙන්නේ පාසැල් පුස්තකාලය (13.8%) හා වෙනත් පුස්තකාල (10.5%) තුළ කියවීම් කටයුතු සිදු කිරීම සම්බන්ධයෙනි.

තම රාජකාරි ස්ථානය තුළ, නිදහස්/සාමාන්‍ය පරිසරයක් තුළ, ගමනාගමනයේ යෙදෙන විට, ආගමික ස්ථානයක, විශ්වවිද්‍යාල පුස්තකාලය වශයෙන් ඒ ඒ ස්ථානවල කියවීමට කැමැත්තක් දක්වන බව අදහස් කර ඇති පාඨකයන් ද මේ අතර සිටී.

### 2.5.3 කියවීමේ රුචිකත්වය පිළිබඳ පාඨක අදහස්

මෙම අධ්‍යයනය හරහා කියවීමේ රුචිකත්වය සම්බන්ධව කරුණු කිහිපයක් පිළිබඳව මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ අදහස් ලබා ගැනීමක් සිදු කරන ලදී.

රූපවාහිනිය නැරඹීමට ඇති බැවින් පොත් කියවීමට කාලයක් නැත, සංගීතය ශ්‍රවණය, කියවීමට වඩා ආශ්වාදජනකය සහ කියවීම, පරිගණක වැඩසටහන් හා පරිගණක ක්‍රීඩා කිරීමට වඩා වැදගත්ය යන ප්‍රකාශ පිළිබඳව ප්‍රතිචාරිකයින්ගේ ප්‍රතිචාරය විමසා බලනු ලැබීය.




ප්‍රස්තාර අංක 29 : කියවීමේ රුචිකත්වය නොමැතිවීමට හේතු පිළිබඳ පාඨක අදහස්

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

රූපවාහිනිය නැරඹීමට ඇති බැවින් පොත් කියවීමට කාලයක් නොමැත යන ප්‍රකාශය 25.4%ක ප්‍රමාණයක් පිළිගන්නා බව දක්වා ඇත. එමෙන්ම සංගීත ශ්‍රවණය, කියවීමට වඩා ආශ්වාදජනකය යන ප්‍රකාශය කෙරෙහි අවම ප්‍රතිශතය වන 15.4% ක පිරිසක් එකග වී ඇත. ඉහත සඳහන් කළ කරුණුවලට වඩා 59.2% කට ආසන්න ප්‍රතිචාරිකයන් පිරිසක් විසින් පිළිගෙන තිබෙන්නේ කියවීම, පරිගණක වැඩසටහන් හා පරිගණක ක්‍රීඩාවලට වඩා වැදගත් බවයි. ඒ අනුව ගම්‍ය වන්නේ බාහිර හේතු සාධක/ක්‍රියාකාරකම්වලට වඩා කියවීම කෙරෙහි මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් ප්‍රමුඛතාවය ලබා දී තිබෙන බවයි.

### 2.5.4 පොත්පත් කියවීමේ දී පාඨකයන් හට පවතින විවිධ බාධක

පොත්පත් කියවීමේ දී පාඨකයන් හට විවිධ ගැටලුකාරී තත්වයන්ට මුහුණදීමට සිදු වේ. මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණක් වූයේ පාඨකයන් විසින් පොත්පත් කියවීමේදී ඇති වන බාධක සම්බන්ධයෙන් ද අධ්‍යයනය කිරීමයි. ප්‍රමාණවත් කියවීමේ ද්‍රව්‍ය නොතිබීම, භාෂාමය බාධක තිබීම, පොත්පත් ආදිය කියවීමට කාලය ප්‍රමාණවත් නොවීම, ආර්ථික දුෂ්කරතා, නවතම පොත් නොතිබීම, තමාගේ රුචිකත්වයට ගැලපෙන කියවීම් ද්‍රව්‍ය නොතිබීම, නිවසේ පරිසරය කියවීමට සුදුසු මට්ටමක නොතිබීම හා අවට පරිසරය කියවීමට සුදුසු තත්වයක නොතිබීම යන බාධක කෙරෙහි අවධානය යොමු කරන ලදී.




ප්‍රස්තාර අංක 30 : පොත්පත් කියවීමේ දී පාඨකයන් හට පවතින විවිධ බාධක

මූලාශ්‍රය : මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

මෙහිදී පැහැදිලිව හඳුනා ගත හැකි වන්නේ වැඩිම ප්‍රතිචාරිකයන් සංඛ්‍යාවක් තම ගැටලුව ලෙස පෙන්වා දී තිබෙන්නේ පොත්පත් ආදිය කියවීමට කාලය ප්‍රමාණවත් නොවන බවයි. එහි අගය 21.4% කි.

එමෙන්ම මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් මුහුණ දෙනු ලබන දෙවන ප්‍රමුඛතම ගැටළුව ලෙස දක්වා තිබෙන්නේ ප්‍රමාණවත් කියවීම් ද්‍රව්‍ය නොතිබීමයි. ලබා දුන් මුළු ප්‍රතිචාර සංඛ්‍යාව අතරින් එම අගය 18.4%කි. පොත්පත් කියවීමේ දී මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් කියවීම සඳහා නවතම පොත් නොතිබීම (17.2%) ඔවුන් විසින් මුහුණපාන තෙවන ප්‍රමුඛතම ගැටලුවක් ලෙස පෙන්වා දී තිබේ. ඊට අමතරව පිළිවෙළින් තමාගේ රුචිකත්වයට ගැලපෙන කියවීම් ද්‍රව්‍ය නොතිබීම (14.2%), භාෂාමය බාධක පැවතීම (11.2%) සහ අවට පරිසරය කියවීමට සුදුසු තත්වයක නොතිබීම (6.1%) යන බාධක කෙරෙහි ද අවධානය යොමුව තිබේ. ඉහත සඳහන් කළ සියලු ගැටලු/බාධක අතරින් නිවස තුළ කියවීමට සුදුසු පරිසරයක් නොතිබීම යන ගැටලුව සඳහා අවම ප්‍රතිචාර සංඛ්‍යාවක් දක්වා ඇති අතර එම අගය මුළු ප්‍රතිචාර අතරින් 5% කි. අධ්‍යයනයේදී අවධානයට ලක් කළ ගැටලුවලට අමතරව පොත්පත් කියවීමේදි මුහුණපානු ලබන වෙනත් ගැටලුකාරි තත්ත්වයන් කිහිපයක් ලෙස ප්‍රවාහන දුෂ්කරතා පැවතීම, ආතතිමය තත්වයන් හා පොත්වල අවශ්‍ය කොටස් අන්තර්ගත නොවීම යන කරුණු පෙන්වා දී තිබේ.

## 2.6 අදහස්

කියවීමේ රුචිය වර්ධනය කිරීමේ අරමුණින් කියවීමේ කණ්ඩායම් ඇති කිරීම, ආකර්ශනීයව පොත් මුද්‍රණය කිරීම, කියවීමේ තරඟ සංවිධානය, තමා කියවූ පොත පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම, පුස්තකාලයට පොත් තෝරා ගැනීමේදී පාඨක යෝජනා සැලකිල්ලට ගැනීම, පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම හා මහජන පුස්තකාල ආකර්ශනීයව තිබීම යනාදි අදහස් කිහිපයක් පිළිබඳ ප්‍රතිචාරිකයන්ගේ මතය විමසා බලන ලදී.




ප්‍රස්තාර අංක 31 ඃ අදහස් පිළිබඳ ප්‍රතිචාරිකයන්ගේ මතය

මූලාශ්‍රය ඃ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය, 2021

ඉහත ප්‍රස්තාර අංක 31 අනුව අනාවරණය වන්නේ මෙම කරුණු සියල්ල අතරින් ප්‍රතිචාරිකයන් බහුතරයක් විසින් කියවීමේ රුචිය වර්ධනය සඳහා ඉවහල් වන ප්‍රමුඛතම හේතුව ලෙස සඳහන් කර තිබෙන්නේ පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වන බවයි. ඒ සඳහා ප්‍රතිචාරිකයන් විසින් ඉහළ අගයක් ලබා දී තිබෙන අතර එම අගය 17.9% කි.

කියවීමේ රුචිය වර්ධනය කිරීම සඳහා පුස්තකාලයට පොත් තෝරා ගැනීමේදී පාඨක යෝජනා සැලකිල්ලට ගැනීම වැදගත් වන බව ප්‍රතිචාරිකයන් සඳහන් කර තිබේ. ඒ වෙනුවෙන් 16.9% ක අගයක් ලබා දී ඇත. එමෙන්ම කියවීමේ රුචිය වර්ධනය කිරීම උදෙසා මහජන පුස්තකාල ආකර්ශනීයව තබාගැනීමේ වැදගත්කම, ආකර්ශනීයව පොත් මුද්‍රණය කිරීම, තමා කියවූ පොත පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම, කියවීමේ තරඟ සංවිධානය කිරීම හා කියවීමේ කණ්ඩායම් තිබීම පාඨකයින් පෙන්වා දී ඇත.

ඉහත සඳහන් කළ කරුණුවලට අමතරව, ආයතනික සේවකයන් හට පුස්තකාල පරිහරණය සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාලයක් වෙන් කර දීම, පොත් ලබා ගැනීමට හා ලියාපදිංචි වීමට ඔන්ලයින් (Online) තාක්ෂණය භාවිත කිරීම, පුස්තකාල ක්‍රියාකාරකම් අනෙකුත් අයට විස්තර කරදීම, පුස්තකාලය අවට නිදහස් පරිසරයක් නිර්මාණය කිරීම, පාඨක සංවාද හා රැස්වීම් පැවැත්වීම, නව දැනුම ලබා ගත හැකි නව පොත්පත් ලබා ගැනීම, පුස්තකාල කාර්යමණ්ඩලයෙන් පාඨකයන්ට ලැබෙන සහයෝගය වැඩිවීම යනාදිය තුළින් පුස්තකාලයක කියවීම් රුචිය වර්ධනයට ඉවහල් වන බව පෙන්වා දෙයි. පළාත් අනුව හා දිස්ත්‍රික්ක වශයෙන් ද ඉහත කාරණා යටතේ දක්වා ඇති සමීක්ෂණ ප්‍රතිඵල පෙළ ගැස්වීම ඒ ඒ පළාත්වල තීරණ ගැනීමට ඉතා ප්‍රයෝජනවත් වනු ඇත.

# තෙවන පරිච්ඡේදය

## සාරාංශය

### 3.1 පසුබිම් තොරතුරු

වර්තමානයේ මූලිකවම හඳුනා ගැනීමට ලැබෙන්නේ දැනුම පාදක කර ගත් සමාජ ක්‍රමයකි. සමාජය තුළ පැවැත්ම සඳහා දැනුම ප්‍රධාන සාධකයක් බවට පත්ව ඇත. වත්මන් සමාජය තුළ දැනුම ලබා ගැනීම හා වර්ධනය කර ගැනීම සඳහා කියවීම, සවන්දීම, නිරීක්ෂණය හා පරිකල්පනය යන මාර්ග භාවිත කරනු ලැබේ. ඒ අනුව කියවීම මත පදනම්ව දැනුවත් සමාජයක් ඇතිවීම රටක සමාජ සංවර්ධනයේ වැදගත් මිනුම් දණ්ඩක් ලෙස හඳුනා ගත හැකිය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ කියවීමේ රුචිය හා ඒ ආශ්‍රිත තත්වයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමයි.

ඉහත අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වන මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා ආශ්‍රිතව පිහිටුවා ඇති මහජන පුස්තකාල 334ක් ආශ්‍රයෙන් සිදු කරනු ලැබිණි. ඒ අනුව ව්‍යුහගත ප්‍රශ්නාවලි තැපැල් මාර්ගිකව මහජන පුස්තකාල වෙත යොමු කිරීම හරහා සමීක්ෂණය සඳහා අවශ්‍ය දත්ත ලබා ගන්නා ලදී. නියැදිය තෝරාගනු ලැබුවේ නාගරික, ග්‍රාමීය, වතු අංශ, ජන වර්ගය, අධ්‍යාපන මට්ටම් හා විවිධ සමාජ ආර්ථික මට්ටම් පුළුල්ව නියෝජනය වන ආකාරයටය.

මෑත ඉතිහාසය තුළ ශ්‍රී ලංකාවේ පාඨක සමීක්ෂණ කිහිපයක්ම ක්‍රියාත්මක කර තිබේ. විශේෂයෙන්ම 1996-1998 වසරවලදී පාඨක සමීක්ෂණයක් පවත්වා තිබෙන අතර ඒ වන විට පැවති යුධමය වාතාවරණය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් හැර ඉතිරි සියලු පළාත් නියෝජනය වන ආකාරයට එම සමීක්ෂණය ක්‍රියාත්මක කර තිබිණ. ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි යුධමය වාතාවරණය අවසන් වීමෙන් පසුව ක්‍රියාත්මක කරන ලද පළමු පාඨක සමීක්ෂණය ලෙස මෙය සැලකිය හැකිය.

පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පවත්වාගෙන යනු ලබන මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ සමාජ, ආර්ථික හා ප්‍රජා විද්‍යාත්මක පසුබිම, කියවීමේ ද්‍රව්‍ය හා පුරුදු, කියවීම පිළිබඳව පවතින ආකල්ප පාඨකයන් විසින් කියවීම් ද්‍රව්‍ය ලබා ගැනීම, කියවන පරිසරය හා ඒ ආශ්‍රිතව පවතින බාධක සම්බන්ධයෙන් මෙම සමීක්ෂණය ඔස්සේ අධ්‍යයනය කරන ලදී. සමීක්ෂණයට භාජනය වූ පාඨකයන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සලකා බැලීමේදී බහුතර පාඨක ප්‍රමාණයක් ස්ත්‍රී (66.4%) වන අතර, පුරුෂ ප්‍රතිශතය (33.3%)ක අගයක් වේ.

එමෙන්ම පළාත් පාලන ආයතන වන මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා ආශ්‍රිතව ද ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සලකා බැලීමේදී හඳුනා ගත හැකි වන්නේ සැලකිය යුතු මට්ටමේ ස්ත්‍රී පාඨක සංඛ්‍යාවක් ප්‍රාදේශීය සභා ආශ්‍රිතව නියෝජනය වන අතර එහි ස්ත්‍රී හා පුරුෂ වෙනස ද ඉහළ අගයක් ගන්නා බවයි.

ප්‍රතිචාරිකයන්ගේ ප්‍රජා විද්‍යාත්මක සාධක දෙස අවධානය යොමු කිරීමේදී ආගම, ජාතිය හා භාෂාව වැනි වැදගත් ප්‍රජා විද්‍යාත්මක සාධක දෙස අවධානය යොමු කිරීම වැදගත් වේ. ජාතිය හා භාෂාව එකිනෙක සම්බන්ධතාවයක් දක්වයි. පැහැදිලිවම අනාවරණය වන්නේ බෞද්ධ ආගම අදහන බහුතර සිංහල පාඨක ප්‍රජාවක් සිටින අතර සිංහල භාෂාව තම ප්‍රමුඛතම භාෂා මාධ්‍යය ලෙස භාවිත කරන බවයි. පාඨක ප්‍රජාවෙන් 12.4% හින්දු ආගම අදහන අතර ඔවුන් දෙමළ ජාතිකයන් වේ. 6.5% ක ප්‍රතිශතයක් ක්‍රිස්තියානි ආගමට හා 2.8% ක් ඉස්ලාම් ආගමට අයත් වේ.

මහජන පුස්තකාලයක් තම සේවා සැපයීමේදී පාඨකයින්ගේ වයස් මට්ටම් කෙරෙහි අවධානය යොමු කරමින් තම සේවා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට කටයුතු කරයි. මෙම අධ්‍යයනය මඟින් අනාවරණය

වූයේ මුලු පාඨක පිරිස අතරින් වයස අවුරුදු 11 - 15 බහුතර පාඨක ප්‍රජාවක් පුස්තකාලය පරිහරණය කරනු ලබන අතර වයස අවුරුදු 16-25 කාණ්ඩයේ ද සැලකිය යුතු ප්‍රමාණයක් පුස්තකාලය පරිහරණය කරන බවයි. නමුත් වයස අවුරුදු 36 න් පසුව පුස්තකාලය පරිහරණය කරන පාඨකයින්ගේ සීඝ්‍ර අඩු වීමක් දැක ගත හැකි වේ.

අධ්‍යයනය මඟින් පාඨකයින්ගේ අධ්‍යාපන තත්වය හා රැකියාව පිළිබඳව විමසා බලන ලදී. 43% ක ප්‍රතිශතයක් අ.පො.ස ( උ.පෙළ ) සමත්ව ඇති අතර උපාධි හා පශ්චාත් උපාධි ලබා ගත් පාඨකයින් ද සැලකිය යුතු ප්‍රමාණයක් දැකිය හැක. රැකියාවේ ස්වභාවය පිළිබඳව විශ්ලේෂණය කිරීමේදී අනාවරණය වන්නේ රාජ්‍ය සේවයේ නිරත වන පාඨක සංඛ්‍යාව ඉහළ අගයක් ගන්නා බවයි. ඊට අමතරව සැලකිය යුතු ප්‍රමාණයක් පෞද්ගලික හා ස්වයං රැකියා ක්ෂේත්‍රයේ කටයුතු කරන බව ද හඳුනා ගත හැකි විය.

## 3.2 කියවීම් ද්‍රව්‍ය හා කියවීමේ පුරුදු

මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයින් විසින් භාවිත කරන කියවීම් ද්‍රව්‍ය මොනවාද යන්න පිළිබඳව හා කියවීමේ පුරුදු අධ්‍යයනය කරන ලදී. වැඩිම පිරිසක් කියවීම සඳහා සිංහල භාෂාව භාවිත කරන අතර දෙමළ භාෂාවෙන් කියවන පාඨක ප්‍රජාව 19.7% ක් ලෙස හඳුනා ගත හැක. ඉංග්‍රීසි ඇතුලු වෙනත් භාෂා භාවිතය ඉතා අවම වන අතර භාෂා කිහිපයක් භාවිත කරන පාඨක ප්‍රමාණය ඉතා සුලු අගයකි. එම අගය 2.3% ක් වේ. මීට අමතරව සිංහල හා දෙමළ, දෙමළ හා ඉංග්‍රීසි මෙන්ම එම භාෂා ත්‍රිත්වයම ද කියවීම සඳහා භාවිත කරනු ලබන ප්‍රමාණය මුලු පාඨක ප්‍රජාව අතරින් ඉතා සුළු අගයක් වේ.

විවිධ මාධ්‍යයන් පරිශීලනය කිරීම (මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය, විද්‍යුත් මාධ්‍යය හා සමාජ මාධ්‍ය භාවිතය) පිළිබඳව සැලකූ විට අනාවරණය වන්නේ බහුතර ප්‍රතිශතයක් මුද්‍රිත මාධ්‍ය භාවිත කරන බවයි. එම අගය 82.6%කි. මුද්‍රිත මාධ්‍යය පරිශීලනය කිරීම එහි පළාත් ව්‍යාප්තිය හා සංසන්දනය කර බැලීමේදී අනාවරණය වන්නේ බස්නාහිර, දකුණ හා මධ්‍යම යන පළාත් තුළ මුද්‍රිත මාධ්‍ය පරිශීලනය ඉහල අගයක් ලබා ගන්නා අතරම උතුරු මැද පළාත ආශ්‍රයෙන් එහි අවම අගයක් වාර්තා වේ. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය අතරින් රූපවාහිනී භාවිතය සඳහා වැඩි උනන්දුවක් තිබෙන බව මෙම විශ්ලේෂණයේදී අනාවරණය වේ. මාධ්‍ය භාවිතය අතරින් විද්‍යුත් මාධ්‍ය පරිශීලනය සඳහා පාඨකයන් විසින් වැඩි කැමැත්තක් දක්වා තිබේ. එම අගය මුළු ප්‍රතිචාර අතරින් 64% කි. විද්‍යුත් මාධ්‍යය අතුරින් පරිගණකය හා අන්තර්ජාල භාවිතය සඳහා බස්නාහිර, මධ්‍යම හා දකුණු පළාත් ආශ්‍රිතව වැඩි පාඨක පිරිසක් දක්නට ලැබෙන අතර සෙසු පළාත් අතුරින් අවම අගය වාර්තා වන්නේ උතුරු මැද පළාත ආශ්‍රිතවය.

සමාජ මාධ්‍ය අතරින් ෆේස් බුක් (Facebook) භාවිතය සඳහා වැඩි ප්‍රතිචාරකයන් ප්‍රමාණයක් කැමැත්තක් දක්වා තිබෙන අතර, ඉහත සඳහන් කළ මාධ්‍යයන්ට අමතරව වට්ස්ඇප් (WhatsApp), ස්කයිප් (Skype) හා ඉන්ස්ටර්ග්‍රෑම් (Instagram) වැනි මාධ්‍යයන් පරිශීලනය කරන බව ද අනාවරණය වේ. සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳව විමසා බැලීමේදී සෙසු මාධ්‍ය භාවිතයට වඩා වෙනස්කම් කිහිපයක් ඒ ඒ පළාත් ආශ්‍රිතව දැක ගත හැකි වේ. බස්නාහිර පළාත තුළ ෆේස්බුක්, යූ ටියුබ් හා වයිබර් යන සමාජ මාධ්‍ය පරිශීලනය සඳහා වැඩි උනන්දුවක් දක්වන බව අනාවරණය විය. ඊට සාපේක්ෂව දකුණු පළාත තුළ ද ෆෙස්බුක් හා යුටියුබ් භාවිතය කෙරෙහි වැඩි කැමැත්තක් දක්වා තිබේ. නැගෙනහිර හා උතුරු පළාත් ආශ්‍රිතව සලකා බැලීමේදී පිළිවෙළින් ෆේස්බුක් හා වයිබර් යන සමාජ මාධ්‍ය පිරිශීලනය කිරීමට වැඩි කැමැත්තක් දක්වන බව අනාවරණය විය. ඌව පළාත තුළ සමාජ මාධ්‍යයන් පරිශීලනය ඉතා අවම අගයක් වාර්තා වේ.

පුස්තකාලයක පවතින කියවීම් ද්‍රව්‍ය අතරින් මහජන පුස්තකාල ආශ්‍රිත පාඨක ප්‍රජාව විසින් නවකතා කියවීම කෙරෙහි වැඩි රුචිකත්වයක් දක්වන බව අනාවරණය වේ. ඊට අමතරව පුවත්පත්, කෙටිකතා, පරිවර්තන, සඟරා, ආගමික ග්‍රන්ථ, රහස් පරීක්ෂක කතා, අධ්‍යාපනික ග්‍රන්ථ වශයෙන් කියවීමට වැඩි

කැමැත්තක් දක්වන අතර එම මුද්‍රිත මාධ්‍යයන්ට අමතරව සංයුක්ත තැටි (CD/DVD) භාවිතයෙන් , අන්තර්ජාලය හා වෙබ් පිටු ආශ්‍රයෙන් ද නවීන තාක්ෂණය භාවිතයෙන් කියවීමට කැමැත්තක් දක්වනු ලබයි.

කියවීම් ද්‍රව්‍ය අතුරින් අන්තර්ජාල වෙබ් පිටු භාවිත කිරීම සඳහා පාඨකයින් විසින් ජංගම දුරකථන භාවිතා කරන බව පෙනී යයි. ඊට අමතරව ඩෙස්ක්ටොප්/ලැප්ටොප් පරිගණක භාවිත කරන අතරම ටැබ් පරිගණක ද අවම වශයෙන් භාවිත කරයි.

කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී ඒ සඳහා ප්‍රමුඛතාවයක් ලබා දීම ප්‍රතිචාරිකයන්ගේ වයස, අධ්‍යාපන මට්ටම, නියුක්තව ඇති අධ්‍යයන/ඨකියා කටයුතු මත මූලිකවම පදනම් වී ඇති ආකාරයක්ද මෙම විශ්ලේෂණයෙන් අනාවරණය වේ. වයස් මට්ටම් අනුව සලකා බැලීමේදී ශිෂ්‍යය ප්‍රජාව නියෝජනය ඉහළ අගයක් ගන්නා අතර ඔවුන් විවිධ අධ්‍යයන කටයුතුවල නිරත වේ. එබැවින් මහජන පුස්තකාල ආශ්‍රිතව පවතින කියවීම් ද්‍රව්‍ය අතරින් නවකතා, කෙටිකතා, පරිවර්තන, රහස් පරීක්ෂක හා අධ්‍යාපනික ග්‍රන්ථ හා චරිතාපදාන ආදිය කියවීම කෙරෙහි වැඩි ප්‍රමුඛතාවක් ලබා දී තිබෙන බව අනාවරණය වේ.

පොත් කියවීම සඳහා ගත කරන කාලය සලකා බැලීමේ දී අවමය දිනකට පැය 02ක් ලෙසත්, සතියකට දින 02කට උපරිමයකට යටත්ව කියවීමේ කටයුතු සිදු කරන බව අනාවරණය වේ. එහෙත් පුද්ගලයෙක් පොත් කියවීම සඳහා ගත කරන සාමාන්‍ය දින ගණනෙහි වෙනසක් ප්‍රධාන භාෂා මාධ්‍ය ත්‍රිත්වය අනුව දක්නට ලැබේ. සිංහල භාෂාව ආශ්‍රයෙන් කියවන පුද්ගලයන් සාමාන්‍යයෙන් සතියකට දින 02 කියවනු ලබයි. ඉංග්‍රීසි භාෂාවෙන් පොත් කියවන්නන් සාමාන්‍යයෙන් සතියකට දින 02ක් වේ. දිනකට පොත් කියවන සාමාන්‍ය පැය ගණන, භාෂාව අනුව ලැබී ඇති තොරතුරු අනුසාරයෙන් ගණනය කරන ලදී. සිංහල භාෂාවෙන් පොත් කියවන්නන් සාමාන්‍යයෙන් දිනයකදී පැය 04ක් පමණ කියවීමේ නිරත වේ. දෙමළ භාෂාවෙන් පොත් කියවන්නන් දිනකට පැය 03ක් හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් දිනකට පැය 01-02ක් අතර කාලයකදී කියවීමේ කටයුතු සිදු කරන බව අනාවරණය වේ. එමගින් පැහැදිලි වන්නේ භාෂා මාධ්‍යයන් අනුව කියවීම සඳහා භාවිත කරනු ලබන කාලය දින හා පැය වශයෙන් වෙනසක් දැක ගත හැකි බවයි.

කියවීම සඳහා කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් විවිධ කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව මෙම අධ්‍යයනය හරහා අනාවරණය විය. විශේෂයෙන්ම වයස් කාණ්ඩ අනුව එම තෝරාගැනීම් සිදු කිරීමේ දී සැලකිලිමත් වන කරුණු කෙරෙහි අවධානය යොමු කරන විට පෙනී යන්නේ වයස් කාණ්ඩ අනුව ඒ ඒ කරුණු කෙරෙහි දක්වන සැළකිලිමත්භාවයේ පැහැදිලි වෙනසක් දක්නට ලැබෙන බවයි.

මෙම කරුණු මත පදනම්ව කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීමේදී අවුරුදු 11-25 හා 16-25 වයස් කාණ්ඩයට අයත් පාඨකයන් වැඩි ප්‍රමුඛත්වයක් ඒ සම්බන්ධයෙන් දක්වන බව අනාවරණය විය. නමුත් අවුරුදු 26 සිට 55 දක්වා වයස් කාණ්ඩ අනුව සලකා බැලීමේදී කියවීම් ද්‍රව්‍ය තෝරා ගැනීම කෙරෙහි දක්වන සැලකිළිමත්භාවයේ අඩුවීමක් දැක ගත හැකි වේ.

පොත්පත් බැහැර ගෙන යාමට, පොත්පත් කියවීමට හා පුවත්පත් කියවීම සඳහා මහජන පුස්තකාල භාවිත කිරීම ප්‍රමුඛතම අරමුණු ලෙස හඳුනා ගත හැකි වේ. ඨකියා අවස්ථාවන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට හා පරිගණක භාවිතය වැනි වෙනත් අරමුණු වෙනුවෙන් ද මහජන පුස්තකාල භාවිත කරන සැලකිය යුතු පාඨක පිරිසක් දක්නට ලැබේ.

මහජන පුස්තකාල සඳහා අවශ්‍ය පොත් තෝරා ගැනීමට පාඨකයින් විසින් විවිධ ක්‍රම භාවිතයට ගන්නා ආකාරයක් දැක ගත හැකිය. පොත් රාක්කය ළඟට ගොස් සොයා බැලීම හරහා පොත් තෝරා ගැනීමට පාඨකයන් වැඩි කැමැත්තක් දක්වන බව අනාවරණය විය. ඊට අමතරව පුස්තකාල සූචිය පරීක්ෂා කිරීම

හා පුස්තකාල කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව පොත්පත් තෝරා ගැනීම් කටයුතුවල නිරත වන බව ද අනාවරණය විය.

## 3.3 කියවීම පිළිබඳ ආකල්ප

මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයින් විසින් තොරතුරු ලබා ගැනීමේ අරමුණ සහිතව පොත්පත් කියවීමෙහි නිරත වේ. ඊට අමතරව සාමාන්‍ය දැනුම වැඩි කර ගැනීම, විවේකය විනෝදාස්වාදය ලබා ගැනීම අරමුණු කර ගනිමින් පොත් පත් කියවීමේ කටයුතුවල යෙදෙන බව ද හඳුනා ගත හැක.

කියවීමෙන් දැනුම වර්ධනය වේ, කියවීමෙන් අත්දැකීම් ලැබේ, විභාග සාමාර්ථය සඳහා කියවීම වැදගත්ය සහ කියවීම නීරසය යන විවිධ අදහස් සම්බන්ධයෙන් පාඨකයින් විසින් දක්වන ලද මතය විමසා බැලීමට ලක් කරන ලදී. ඒ අනුව වැඩිම පාඨක පිරිසක් කියවීමෙන් දැනුම වර්ධනය වේ යන මතය සමග එකඟ වේ. ඊට අමතරව කියවීමෙන් අත්දැකීම් ලැබේ, විභාග සාමාර්ථ සඳහා කියවීම වැදගත්ය යන අදහස් කෙරෙහි ද ප්‍රමුඛතාවය ලබා දී තිබේ. කියවීම නීරසය යන මතය පාඨකයන් විසින් බැහැර කර තිබේ.

මෙම සමීක්ෂණය ඔස්සේ ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් තම කියවීමේ රුචිකත්වය තවදුරටත් නියෝජනය වන පරිදි ඔවුනොවුන් විසින් කැමැත්තක් දක්වන කර්තෘවරුන් පිළිබඳව ද අදහස් ලබා ගන්නා ලදී. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් දේශීය විදේශීය ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි කර්තෘන් විශාල ප්‍රමාණයක් නම් කර තිබේ. ඒ අනුව දේශීය කර්තෘවරුන් අතරින් මාර්ටින් වික්‍රමසිංහ මහතා බහුතර පාඨක ප්‍රමාණයකගේ කැමැත්ත හිමි කර ගෙන තිබේ. දෙමළ කර්තෘන් අතරින් රාජේෂ් කුමාර් (Rajesh Kumar) ප්‍රමුඛතාවය හිමි කර ගෙන තිබේ.

ඊට අමතරව චන්ද්‍රි කොඩිකාර, සුජීව ප්‍රසන්න ආරච්චි, මැක්සිම් ගෝර්කි, ආතර් කොනන් ඩොයිලි, චන්දන මෙන්ඩිස්, කුමාරතුංග මුනිදාස හා යෞවන සමීන්ද්‍ර යන කර්තෘවරුන් කෙරෙහි ද වැඩි රුචිකත්වයක් දක්වන බව අනාවරණය විය.

## 3.4 කියවීම් ද්‍රව්‍ය ලබා ගැනීම

පුස්තකාලය හරහා, මිතුරන්ගෙන්, පවුලේ සාමාජිකයන්ගෙන් හා අන්තර්ජාලය යන ක්‍රම ඔස්සේ කියවීම් ද්‍රව්‍ය ලබා ගැනීම කෙරෙහි පාඨකයන් කැමැත්තක් දක්වන බව මෙම අධ්‍යයනය හරහා අනාවරණය විය. එම ක්‍රම අතරින් වැඩි පාඨක පිරිසක් කියවීම් ද්‍රව්‍ය ලබා ගැනීමට උත්සුක වන්නේ පුස්තකාලය හරහා බව මෙහිදී පෙන්වා දී තිබේ. ඊට අමතරව මිතුරන් මාර්ගයෙන් හා පවුලේ සාමාජිකයන් හරහා කියවීම් ද්‍රව්‍ය ලබා ගැනීමට උත්සුක වන බව අනාවරණය වේ.

පාඨකයන් විසින් හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් විසින් පසුගිය මාස 06ක කාලසීමාව තුළ විවිධ කියවීම් ද්‍රව්‍ය මිල දී ගෙන තිබෙන අතර එය මුළු පාඨක සංඛ්‍යාව අතරින් 84%ක් තරම් ඉහළ අගයක් වේ. ඒ අනුව පැහැදිලි වන්නේ බහුතර පාඨක සංඛ්‍යාවක් කියවීම් ද්‍රව්‍ය මිල දී ගැනීමට කැමැත්තක් දක්වන බවයි. එමෙන්ම එම කාල සීමාව තුළ දී කිසියම් හෝ කියවීම් ද්‍රව්‍යයක් මිල දී නොගැනීමට හේතුව වශයෙන් බහුතර ප්‍රතිචාරිකයන් පිරිසක් විසින් පෙන්වා දී තිබෙන්නේ පුස්තකාලය හරහා අධ්‍යාපන හා කියවීම් කටයුතු කිරීම හේතුවෙන් කියවීම් ද්‍රව්‍ය මිල දී ගැනීමට කැමැත්තක් නොදක්වන බවයි. ඊට අමතරව පොත්වල මිල අධික වීම, පහසු වේලාවක් නොමැතිවීම යන කරුණු ද ඊට හේතු වන බව පෙන්වාදී තිබේ.

පසුගිය මාස 06ක කාල සීමාව තුළ මිල දී ගත් කියවීම් ද්‍රව්‍ය පිළිබඳව සලකා බැලීමේදී වැඩි පිරිසක් විසින් මිල දී ගෙන තිබෙන්නේ පොත් වන අතර එය 37%ක ප්‍රතිශතයක් ගනී. ඊට අමතරව පිළිවෙළින් පුවත්පත් (35%)ක් හා සඟරා (27%)ක ප්‍රමාණයක් මිල දී ගෙන තිබෙන බව අනාවරණය වේ. මහජන

පුස්තකාලයට අමතරව පාඨකයන් විසින් භාවිත කරනු ලබන වෙනත් පුස්තකාල වර්ග අතරින් පාසැල් පුස්තකාල පරිහරණයට වැඩි පිරිසක් යොමු වී ඇති බව හඳුනා ගත හැකි වේ. පාඨකයන්ගේ ප්‍රජා විද්‍යාත්මක, සමාජීය හා ආර්ථික සාධක අනුව පුස්තකාල භාවිතයේ වෙනසක් දක ගත හැකි වන අතර ඒ අනුව පාසැල්, යෞවන සමාජ පුස්තකාල, රාජ්‍ය නොවන සංවිධාන පුස්තකාල, විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපනික ආයතන පුස්තකාල මහජන පුස්තකාලයට අමතරව පාඨකයන් විසින් භාවිතයට ගැනීමට කැමැත්තක් දක්වන පුස්තකාල වේ.

### 3.5 කියවන පරිසරය හා බාධක

මෙම සමීක්ෂණය මගින් ප්‍රතිචාරිකයන්ගේ නිවෙස්වල පොත් එකතුවක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කරුණු විමසන ලද අතර සමස්ත ප්‍රතිචාරිකයන් අතුරින් 72%ක ප්‍රමාණයක් තම නිවෙස තුළ පොත් එකතුවක් පවත්වාගෙන යන බව සඳහන් කර තිබේ.

නිවස, පාසල් පුස්තකාලය, මහජන පුස්තකාලය හා වෙනත් පුස්තකාල අතරින් ප්‍රතිචාරිකයින් විසින් කියවීමට වඩාත් කැමති ස්ථානයක් ලෙස 40.1%කට ආසන්න ප්‍රමාණයක් තම නිවස තුළ කියවීම් කටයුතු සිදු කිරීමට කැමැත්තක් දක්වන බව පෙන්වා දී තිබේ. ඊට අමතරව මහජන පුස්තකාලය (35.6%) හා පාසල් පුස්තකාලය (13.8%) ආශ්‍රිතව කියවීම් කටයුතු සිදු කිරීමට කැමැත්තක් දක්වන පාඨකයින් සිටී.

මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන් විසින් කියවීම හා එහි පවතින වටිනාකම සම්බන්ධයෙන් අදහස් කිහිපයක් විමසා බැලූ අතර එහිදී පැහැදිලිව හඳුනා ගත හැකි වූයේ තම තමන් විසින් සිදු කරනු ලබන සෙසු ක්‍රියාකාරකම්වලට සාපේක්ෂව කියවීම් කටයුතු සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙන බවයි.

පොත්පත් කියවීමේදී පාඨකයන් හට විවිධ බාධක/ගැටලුකාරී තත්වයන්ට මුහුණදීමට සිදු වේ. වැඩිම ප්‍රතිචාරිකයන් සංඛ්‍යාවක් තම බාධකය/ගැටලුව ලෙස පෙන්වා දී තිබෙන්නේ පොත්පත් ආදිය කියවීමට කාලය ප්‍රමාණවත් නොවන බවයි. එහි අගය 21.4% කි. ප්‍රමාණවත් කියවීම් ද්‍රව්‍ය නොතිබීම (18.4%), කියවීම සඳහා නවතම පොත් නොතිබීම (17.2%) ඔවුන් විසින් මුහුණපාන ප්‍රමුඛතම ගැටලු ලෙස පෙන්වා දී තිබේ. ඉහත ගැටලුවලට අමතරව ප්‍රවාහන දුෂ්කරතා පැවතීම, ආතතිමය තත්වයන් හා පොත්වල අවශ්‍ය කොටස් අන්තර්ගත නොවීම යන කරුණු ද අනාවරණය විය.

පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම (16.9%), පුස්තකාලයට පොත් තෝරා ගැනීමේදී පාඨක යෝජනා සැලකිල්ලට ගැනීම (17.9%), මහජන පුස්තකාල ආකර්ශනීයව තබාගැනීම (15.4%), ආකර්ශනීයව පොත් මුද්‍රණය කිරීම (14.7%), කියවීමේ රුචිය වර්ධනය සඳහා ඉවහල් වන ප්‍රමුඛතම හේතූන් ලෙස හඳුනා ගත හැකි වේ. ඉහත සඳහන් කළ කරුණුවලට අමතරව තරග සංවිධානය කිරීම, ආයතනික සේවකයන් හට පුස්තකාල පරිහරණය සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාලයක් වෙන් කර දීම, පොත් ලබා ගැනීමට හා සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ලියාපදිංචි වීමට ඔන්ලයින් (Online) තාක්ෂණය භාවිත කිරීම, පුස්තකාල ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු සැපයීම, පුස්තකාලය අවට නිදහස් පරිසරයක් නිර්මාණය කිරීම, පාඨක සංවාද හා රැස්වීම් පැවැත්වීම, නව දැනුම ලබා ගත හැකි නව පොත්පත් ලබා ගැනීම, පුස්තකාල කාර්යමණ්ඩලයෙන් පාඨකයන්ට ලැබෙන සහයෝගය වැඩි කිරීම යනාදී තත්වයන් තුළින් පාඨකයන්ගේ කියවීම් රුචිය වර්ධනය කළ හැකි බව පෙන්වා දිය හැකිය.

# සිව්වන පරිච්ඡේදය

## නිර්දේශ

මහජන පුස්තකාල භාවිත කරනු ලබන පාඨකයන්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණය මගින් පාඨකයන් තුළ කියවීමට පවතින කැමැත්ත, එහි ප්‍රවණතා සම්බන්ධයෙන් මෙම අධ්‍යයනය හරහා අනාවරණය කර ගැනීමට හැකි විය. එම අනාවරණයන් අනුව අනාගත සැලසුම් හා ක්‍රමවේදයන් සංවර්ධනය කිරීමේ හා සැලසුම් කිරීමේ අරමුණින් සමීක්ෂණය හරහා හෙළි කර ගත් තොරතුරු ඇසුරින් නිර්දේශ ඉදිරිපත් කළ හැකිය.

- මහජන පුස්තකාල භාවිත කරනු ලබන පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතාව පදනම් කර ගනිමින් මුද්‍රිත මාධ්‍ය පරිශීලනය කිරීමට ඇති අවස්ථාව වැඩි කිරීම යෝග්‍ය වේ.

- මහජන පුස්තකාල විසින් පවත්වාගෙන යන සේවාවන්ට අමතරව පරිගණක හා අන්තර්ජාල තාක්ෂණය භාවිත කර තොරතුරු සේවාවන් සැලසුම් කිරීම සුදුසුය.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (Information and Communication Technology) සම්බන්ධයෙන් හා එහි භාවිතයන් සම්බන්ධයෙන් මහජන පුස්තකාල කාර්යමණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබා දීම.

- පාඨකයන්ගේ කැමැත්ත හා අවශ්‍යතාවය පිළිබඳව විමසා බලා පුස්තකාල කියවීම් ද්‍රව්‍ය (නවකතා, කෙටි කතා, පරිවර්තන, පද්‍ය හා අධ්‍යාපනික ග්‍රන්ථ වශයෙන්) ක්‍රමවත් ආකාරයකට පාඨකයන් වෙත ලබා දීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

- කියවීම සඳහා ගත කරන කාලය ප්‍රමාණවත් නොවන බැවින් කියවීම් කටයුතු සිදු කිරීම වෙනුවෙන් අමතර කාලයක් (දිනකට හෝ සතියකට) යොදවා ගැනීම අවශ්‍ය වේ.

- පොත්පත් බැහැරට ගෙන යාමේ අරමුණින් පාඨකයන් විසින් මහජන පුස්තකාල භාවිත කරන බැවින් මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ පොත් නිකුත් කිරීමේ ක්‍රමවේදයක් ආරම්භ කිරීම වැදගත් වේ.

- පුස්තකාලය සතු අධ්‍යාපනය සම්බන්ධ ඉගෙනුම් ආධාරක සම්පත් සංවර්ධනය කිරීම ඊට අමතරව නව තාක්ෂණයෙන් යුත් උපකරණ හා මෙවලම් හඳුන්වා දීම.

- පුස්තකාල එකතුවේ පවතින ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය උපකරණ (ශ්‍රව්‍ය පට, වීඩියෝ පට, පරිගණක තැටි, අන්තර්ජාල සම්පත්) එකතුව සංවර්ධනය කිරීම හා නවතම උපකරණ පුස්තකාල වෙත අත්පත් කර ගැනීම.

- පුස්තකාල කටයුතු කාර්යක්ෂම කිරීම උදෙසා තොරතුරු ඉතා කඩිනමින් පාඨකයන් වෙත ලබා දීමේ අරමුණින් පුස්තකාල සුචි (පරිගණක සූචිය) පවත්වාගෙන යාම විධිමත් කිරීම හා දැනට එබඳු සූචි භාවිතයට නොගන්නා පුස්තකාල වෙත සූචිකරණ ක්‍රියාවලියේ ඇති වැදගත්කම සම්බන්ධයෙන් දැනුවත් කිරීම හා ඊට අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීම.

- ග්‍රන්ථ විද්‍යාත්මක සංවිධානයේදී පුස්තකාලයේ පවතින පොත් පත් හා ලිපි ලේඛන සංවිධානය කළ යුතු ආකාරය සම්බන්ධයෙන් ඒ පිළිබඳ මනා දැනුමක් ඇති නිලධාරීන් හරහා අවශ්‍ය මාර්ගෝපදේශන සේවාවන් ලබා දීම.

- පවතින පුස්තකාල එකතුවල අමතරව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ වැදගත් නව පර්යේෂණ ලිපි එකතු, ගුරු මාර්ගෝපදේශ එකතු, විවිධ විෂය සමගාමී එකතුන් ආරම්භ කිරීම හා තිබෙන එකතු සංවර්ධනය කිරීම.

- වාර්ෂිකව පොත් මිල දී ගැනීමේ දී ඒ වෙනුවෙන් දැනට වැය කරන මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය වැඩි කිරීම හා පරිත්‍යාග හා වෙනත් මාර්ග ඔස්සේ පොත් ලබා ගැනීමට උනන්දු වීම හරහා පුස්තකාල පොත් එකතුව වර්ධනය කිරීම උදෙසා ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම.

- පුස්තකාල වෙත ඡායා පිටපත් යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර ආදී උපකරණ මිල දී ගැනීම හා ඒ ආශ්‍රිත සේවාවන් පුළුල් කිරීම.

- මහජන පුස්තකාල ජාලයක් (Library Network) නිර්මාණය කිරීම. එමගින් එක් එක් පුස්තකාල සේවා අතර මනා සම්බන්ධීකරණයක් ඇති වීම හා මෙම සේවාවන් පිළිබඳ අවබෝධයක් ද එක් එක් පුස්තකාල සම්බන්ධයෙන් වෙන වෙනම ලබා ගත හැකිය. මහජන පුස්තකාල තොරතුරු සම්පත් මධ්‍යස්ථාන (Information Resource Centre) ලෙස තවදුරටත් සංවර්ධනය කිරීම.

- පුස්තකාලයක තාක්ෂණික කටයුතු සහ පාඨක සේවා කටයුතු වඩාත් කාර්යක්ෂමව පවත්වාගෙන යාම අරමුණු කර ගනිමින් පුස්තකාල ස්වයංක්‍රීයකරණ පද්ධති මහජන පුස්තකාල සඳහා හඳුන්වා දීම සුදුසු වේ. විවෘත කේත මෘදුකාංගයක් වන කොහා මෘදුකාංගය දැනටමත් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සැලකිය යුතු ප්‍රමාණයක් භාවිතයට පෙළඹී සිටීම විශේෂ ලක්ෂණයකි.

- නිවස තුළ ගෘහ පුස්තකාල ඒකක ආරම්භ කිරීමට හා පවතින පුස්තකාල හෝ පොත් එකතු තව දුරටත් සංවර්ධනය කිරීමට හා කළමනාකාරණය කර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම හා දිරි ගැන්වීම.

- පුස්තකාලය වෙත අවශ්‍ය පොත් හා වෙනත් කියවීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී කාලීනව ඇති වැදගත්කම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.

- පොත්පත් කියවීම සඳහා පුස්තකාල විසින් ලබා දී තිබෙන කාලය පාඨකයන්ගේ අවශ්‍යතාවයන් සළකා බලා දීර්ඝ කිරීම.

- මහජන පුස්තකාල පාඨක සමාජ (Reading Socities) ආරම්භ කිරීම හා තිබෙන පාඨක සමාජ සවිබල ගැන්වීම තුළින් කියවීම හා ඒ ආශ්‍රිත නව ප්‍රවණතා පාඨකයන් අතර හුවමාරු කර ගැනීමට අවස්ථාව සැලසීම.
- කියවීමේ රුචිකත්වය වර්ධනය කිරීමේ අරමුණින් පාඨකයන් අතර කියවීමේ තරඟ සංවිධානය කිරීම.
-

- පාඨකයන් හට නිදහස් මනසකින් යුක්තව කාලය ගත කිරීමට අවශ්‍ය ආකාරයට පුස්තකාල පරිශ්‍රය (අභ්‍යන්තර හා බාහිර) සකස් කිරීම. විශේෂයෙන්ම මහජන පුස්තකාලය ආකර්ශනීය ආකාරයට පවත්වාගෙන යාම.

- වාර්ෂිකව හෝ අවශ්‍ය අවස්ථාවන්හිදී පුස්තකාලය වෙත පොත් මිල දී ගැනීම් කටයුතුවලදී පාඨකයන්ගේ (විවිධ වයස් මට්ටම් අනුව) පාඨක යෝජනා සැලකිල්ලට ගැනීම.

- පොත්පත් ඇතුළු මුද්‍රිත මාධ්‍ය කියවීම් ද්‍රව්‍ය මුද්‍රණය කිරීමේදී ආකර්ෂණීය නිමාව පිළිබඳ සැලකිලිමත් වීම.

- පාඨකයන්ට කියවීමෙහි දී ඇති වැදගත්කම, කියවීම් පුරුදු සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- පාඨකයන් හට සහනදායී මිල ගණන් යටතේ පොත් මිලදී ගැනීමට අවස්ථාව සලසා දීම. උදාහරණයක් ලෙස සාහිත්‍ය මාසය (සැප්තැම්බර්) සහ පොත් ප්‍රකාශකයින් වෙතින් සහනදායි මිල ගණන් යටතේ පොත් මිලදී ගැනීමට අවස්ථාව සැලසීම.

- මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයන්ගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම වෙනත් භාෂා මාධ්‍යයන් හා සංසන්දනය කර බැලීමේදී අඩු අගයක් වාර්තා වන බැවින් ඉංග්‍රීසි භාෂා නිපුණතාවය වර්ධනය කිරීම වෙනුවෙන් වැඩසටහන් පැවැත්වීම සුදුසුය.

- එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සාමාජික රටවල්වල ආයතන 2030 වර්ෂය වන විට සපුරාගත යුතු තිරසර සංවර්ධන (Sustainable Development Goals, 2030)ඉලක්ක 17ක් ඉදිරිපත් කර තිබේ. මෙම ඉලක්ක 17 අතුරින් හතරවන ඉලක්කය වන සංයුක්ත හා සමානතාවයෙන් යුතු ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කරමින් සැමට ජීවිත කාලය පුරා ඉගෙනුම අවස්ථාව උදාකර දීම වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කිරීම මහජන පුස්තකාල වෙතින් සිදු කළ යුතුය. ඒ සඳහා වැඩසටහන් සැලසුමම් කළ යුතු අතර ප්‍රාදේශිය වශයෙන් පොදු මහජනතාවට සමීපව හිඳිමින් කටයුතු කිරීමට මහජන පුස්තකාලයකට ඇති හැකියාව නිසා සෙසු ඉලක්ක සපුරා ගැනීමට ද ක්‍රියාත්මක විය හැකිය.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ගුණරත්න බණ්ඩා. එච්. එම්. (2014). සැමට විඥාපන සාක්ෂරතාව (Information Literary for All). ජාතික කියවීම් මාසය - ඔක්තෝබර්, 23-29, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

හෙට්ටිගේ. සිරි., ජයසිංහ. කේ., සහ ධර්මදාස. පී. ජී. (1997-1998). ශ්‍රී ලාංකික ජනතාවගේ කියවීමේ පුරුදු. කොළඹ, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය.

Awoyemi. O. O. & Yuuf. A. R. (2016). Reading Habits of Users as Determinants of the Utilisation of Library Information Resources of Two Public Libraries in South - West, Nigeria. Library Philosophy and Practice :e-journal).1475.Retrieved from: http://digitalcommons.unl.edu/libphilprac/1475.

Chettri. K., & Rout.S.K. (2013). Reading Habits - An Overview: Journal of Humanities and Social Science: Sep-Oct. 2013. Retrieved from: http://www.iosrjournals.org/iosr-jhss/papers/Vol14-issue6/C01461317.pdf?id=6700#:~:text=Reading%20habit%20refers%20to%20the,.org%2014%20%7C%20Page%20reading.

Department of Census and Statistics. (2012). Census of Population and Housing. Colombo, D.C.&S.

Igwe. (2011). Reading Habits of Users as Determinants of the Utilisation of Library Information Resources of Two Public Libraries in South- West, Nigeria. Library Philosophy and Practice, 1475(01). Retrieved from: http://digitalcommons.unl.edu/libphilprac/1475

Kutay. V. (2014). Survey of the Reading Habits of Turkish High School Students and an Examination of the Efforts to Encourage Them to Read. Centre for Information Management School of Business and Economics. Retrieved from: http://pstorage-loughborough 53465.s3.amazonaws.com/17035076/Thesis2014Kutay.pdf

Lone. (2011). Reading Habits of Users as Determinants of the Utilisation of Library Information Resources of Two Public Libraries in South- West, Nigeria. Library Philosophy and Practice, 1475(01). Retrieved from: http://digitalcommons.unl.edu/libphilprac/1475

National Library & Documentation Services Board. (2014). Readership Survey of School Children in Sri lanka. Colombo, NLDSB.

National Library & Documentation Services Board. (2017). Survey on Reading habits of School Children in Nothern & Eastern Provinces. Colombo, NLDSB

Sethi & Panda. (2012). Reading Habits of Users as Determinants of the Utilisation of Library Information Resources of Two Public Libraries in South- West, Nigeria. Library Philosophy and Practice, 1475(01). Retrieved from: http://digitalcommons.unl.edu/libphilprac/1475

Sohail. M. D. & Alvi.A. (2011). Reading Habits among the Users of Delhi Public Library, New Delhi: A Survey: Brazilian Journal of Information Science. Retrieved from: http://www2.marilia.Unesp.br/revistas/index.php/bjis/index

Stenberg. (2001), Ross. (2002) & Abram. (2007). Reading Habits of Users as Determinants of the Utilisation of Library Information Resources of Two Public Libraries in South- West, Nigeria. Library Philosophy and Practice, 1475:01). Retrieved from: http://digitalcommons.unl.edu/libphilprac/1475

Thanuskodi. (2011). Reading Habits of Users as Determinants of the Utilisation of Library Information Resources of Two Public Libraries in South- West, Nigeria. Library Philosophy and Practice, 1475(01). Retrieved from: http://digitalcommons.unl.edu/libphilprac/1475

Toit. (2001). Reading Habits of Users as Determinants of the Utilisation of Library Information Resources of Two Public Libraries in South- West, Nigeria. Library Philosophy and Practice, 1475(01). Retrieved from: http://digitalcommons.unl.edu/libphilprac/1475

United Nations. (2016). Transforming Our World: The 2030 Agenda for Sustainable Development. United Nations. Retreived from: https://sustainabledevelopment.un.org/content/documents/21252030%20Agenda%20for%20Sustainable%20Development%20web.pdf

UNESCO, IFLA. (1994). Public Library Manifesto, Retrieved from: https://www.ifla.org/publications/iflaunesco-public-library-manifesto-1994

Ustan. (2007), Watson. (2004) & Peligrine. (1985). Reading Habits - An Overview. Journal of Humanities and Social Scienc. 14 (06), pp 13-17. Retrieved from: http://www.iosrjournals.org/iosr-jhss/papers/Vol14issue6/C01461317.pdf?id=6700#:~:text=Reading%20habit%20refers%20to%20the,.org%2014%20%7C%20Page%20reading.

Wagnar. (2013). Reading Habits - An Overview. Journal of Humanities and Social Scienc. 14 (06), pp 13-17. Retrieved from: http://www.iosrjournals.org/iosr-jhss/papers/Vol14-issue6/C01461317.pdf?id=6700#:~:text=Reading%20habit%20refers%20to%20the,.org%2014%20%7C%20Page%20reading.

ඇමුණුම 01

අනුක්‍රමික අංකය / தொடர் இலக்கம் ☐☐☐☐☐

මෙම සමීක්ෂණය මගින් එකතු කරනු ලබන සෑම තොරතුරක්ම අතිශයින්ම රහසිගත ලෙස තබනු ලැබේ.

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
இலங்கைத் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
**කියවීමේ රුචිය පිළිබඳ ජාතික සමීක්ෂණය**
வாசிப்பு ஆர்வமூட்டல் தொடர்பாக மேற்கொள்ளப்படும் தேசிய ஆய்வு
**පාඨකයින් වෙත ඉදිරිපත් කරන ප්‍රශ්නාවලිය**
வாசகர்களிற்கு வழங்கப்படும் வினாக்கொத்து

**(අදාළ පිළිතුර සඳහා √ ලකුණ යොදන්න)**
**(குறித்த விடைகளிற்கு √ அடையாளமிடவும் )**

01. **පසුබිම් තොරතුරු** /பின்புலத் தகவல

1.1 පළාත් පාලන ආයතනය /உள்ளூராட்சி நிறுவனம ..........................................................................

1.2 පළාත් පාලන ආයතනය අයත් දිස්ත්‍රික්කය /உள்ளூராட்சி நிறுவனம், மாவட்டம் ................................

1.3 පුස්තකාලයේ නම / நூலகத்தின் பெயர் ...........................................................................................

1.4 ස්ත්‍රී පුරුෂ භාවය /பால் விபரம் :

1. ස්ත්‍රී /பெண் ☐
2. පුරුෂ /ஆண் ☐

1.5 ආගම /சமயம் :

1. බෞද්ධ /பௌத்தம் ☐
2. හින්දු /இந்து ☐
3. ඉස්ලාම් /இஸ்லாம் ☐
4. කතෝලික /கிறிஸ்தவம் ☐
5. වෙනත් /ஏனையவை (සඳහන් කරන්න /குறிப்பிடவும்) ☐ ..........................................................

1.6 ජාතිය / :

1. සිංහල /சிங்களவர் ☐
2. දෙමළ /தமிழர் ☐
3. මුස්ලිම් / இஸ்லாமியர் ☐
4. මැලේ / மலாயர் ☐
5. බර්ගර් / பரங்கியர் ☐
6. වෙනත් /ஏனையவை (සඳහන් කරන්න /குறிப்பிடவும்) ☐ ..........................................................

1.7 වයස් කාණ්ඩය / வயதுப் பிரிவு

1. 116 - 25 ☐
2. 26 - 35 ☐
3. 36 - 45 ☐
4. 46 - 55 ☐
5. 56 ට වැඩි/ மேல் ☐ ☐

1.8 ලබා ඇති උසස්ම අධ්‍යාපන මට්ටම/ பெற்றுள்ள அதிகூடிய கல்வித் தகைமை

1. 1-8 වන ශ්‍රේණිය දක්වා ඉගෙනීම ලබා ඇති/1 – 8 ஆம் தரம் வரையிலான கல்வித் தகைமை ☐
2. 8 වන ශ්‍රේණිය සමත්/8 ஆம் தரம் சித்தி ☐
3. 10 වන ශ්‍රේණිය සමත්/ 10 ஆம் தரம் சித்தி ☐
4. අපොස (සා. පෙළ) සමත්/க.பொ.த. (சா/த) சித்தி ☐
5. අපොස (උසස් පෙළ) සමත්/க.பொ.த. (உ/த) சித்தி ☐
6. උපාධි ඩිප්ලෝමා/பட்டப்படிப்பு: டிப்ளோமா ☐
7. පශ්චාත් උපාධි පාඨමාලා/பட்டப்பின் படிப்பு ☐
8. පාසල් අධ්‍යාපනය ලබා නොමැති /பாடசாலை கல்வி கற்கவில்லை ☐

1.9 ඔබ දැනට නියුක්තව ඇති අධ්‍යයන/රැකියා කටයුතු/ பெற்றுள்ள அதிகூடிய கல்வித் தகைமை :

1. පාසල් ශිෂ්‍ය/ பாடசாலை மாணவர் ☐
2. විශ්වවිද්‍යාල ශිෂ්‍ය/பல்கலைக்கழக மாணவர் ☐
3. රැකියාවක නියුක්ත/தொழில் புரிவோர் ☐
4. විශ්‍රාමික/ ஓய்வு பெற்றோர் ☐
5. රැකියා විරහිත/ தொழில் புரியாதவர் ☐
6. වෙනත් අධ්‍යයන කටයුතු/ ஏனைய கல்வி ☐

(සඳහන් කරන්න/ குறிப்பிடவும்) ..............................................................................

1.10 ඔබ රැකියාවක් /ආර්ථික කටයුත්තක් කරන්නේ නම් එහි ස්වභාවය / தொழில்/பொருளாதாரம் நடவடிக்கைக்காக செய்யப்படும் தொழில் தன்மை

**රැකියාවේ ස්වභාවය / தொழில் தன்மை**

1. රාජ්‍ය/අර්ධ රාජ්‍ය සේවක / அரச / அரச சார்பற்ற தொழில் ☐
2. පෞද්ගලික ආයතනයක සේවයේ නියුතු / தனியார் நிறுவன தொழில் ☐
3. ස්වයං රැකියා (තමාගේම ව්‍යාපාරයක්) / சுயதொழில் (தன்னுடைய வியாபாரம் ☐
4. විදේශ (රැකියා) / வெளிநாட்டு தொழில் ☐

## 2. කියවීමේ ද්‍රව්‍ය හා පුරුදු// வாசிப்பு ஆவணமும் பழக்கமும்

2.1 ඔබ වැඩියෙන්ම කියවන්නේ කුමන භාෂාවෙන්ද?/ / நீங்கள் வாசிப்பதற்கு கூடுதலாக பயன்படுத்தும் மொழி எது?

1. සිංහල/ சிங்களம் ☐
2. දෙමළ / தமிழ் ☐
3. ඉංග්‍රීසි/ ஆங்கிலம் ☐
4. වෙනත්/ ஏனையவை ☐

(සඳහන් කරන්න / குறிப்பிடவும்) ..............................................................................

2.2 පහත දක්වා ඇති මාධ්‍යවලින් ඔබ වැඩියෙන්ම පරිශීලනය කරන මාධ්‍ය සඳහන් කරන්න. (1,2,3 ............. ලෙස අනුපිළිවෙලි සඳහන් කරන්න) / கீழே குறிப்பிடப்படும் ஊடகங்களில் நீங்கள் உபயோகப்படுத்துதம் ஊடகத்தை குறிப்பிடவும். (1,2, 3 ..... என ஒழுங்குபடுத்தவும்)

මුද්‍රිත මාධ්‍ය / அச்சீட்டு சாதனம்

1. පොත් / புத்தகம் ☐
2. පුවත්පත් / புதினத்தாள் ☐
3. සඟරා/ பருவ இதழ்கள் ☐

ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය / ஊடக சாதனம்

1. රූපවාහිනිය /தொலைக்காட்சி ☐
2. ගුවන් විදුලිය / வானொலி ☐

විද්‍යුත් මාධ්‍ය /இலத்திரனியல் சாதனம்

1. පරිගණක /கணினி ☐
2. සංයුක්ත තැටි /இறுவெட்டுக்கள் ☐
3. අන්තර්ජාලය/இணையம் ☐

සමාජ මාධ්‍ය /சமூக வலைத்தளம்

1. You Tube ☐
2. Facebook ☐
3. Twitter ☐
4. Linkedin ☐
5. Viber ☐
6. Imo ☐

වෙනත් / ஏனையவை

(සඳහන් කරන්න/ குறிப்பிடவும்) ...........................................................................................

2.3 පහත සඳහන් කියවීම් ද්‍රව්‍ය ඔබ කියවීමට කැමති/අකමැති බව සඳහන් කරන්න ('√' ලකුණ යොදන්න) கீழே குறிப்பிடப்படும் வாசிப்பு சாதனங்களில் நீங்கள் வாசிக்க விருப்பும் / விரும்பாதனவற்றைக் குறிப்பிடவும். (குறிப்பிட்ட பெட்டியில் '√' இடவும்)

